# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 798/24 – 1993 දෙසැම්බර් 24 වැනි සිකුරාදා – 1993.12.24

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (අ) වැනි කොටස — පළාත් සභා

## පළාත් සභා නිවේදන

### 1993 අංක 05 දරන සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය

1993 දෙසැම්බර් මස 23 වන දින සබරගමුව පළාත් සභාව විසින් සම්මත කරන ලද උක්ත ප්‍රඥප්තියේ විධිවිධාන 1993 දෙසැම්බර් මස 23 වන දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් දන්වා සිටිමි.

ඒ. ඒ. විජේතුංග,
කර්මාන්ත, වෙළඳ, නිවාස, ග්‍රාම සංවර්ධන
හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය
සබරගමුව පළාත් සභාව.

### නිවාස සංවර්ධන අරමුදලක් පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 1 වන උපලේඛනයේ 5 වන කොටසට අනුකූලව සකස් කරන ලද ප්‍රඥප්තියකි.

ආධාර දෙනු ලබන අත්කම් නිවාස ව්‍යාපෘති, නිවාස ණය සහ ගොඩනැගිලි උපකරණ සැපයීම ඇතුළුව (ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති නොවන) පළාත්බද නිවාස සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම ආදී අරමුණු ඉටුකර ගැනීමට පළාත් සභාවට ඇති බලතල අනුව එකී අරමුණු ඉටු කර ගැනීම පිණිස අරමුදලක් පිහිටුවා ගැනීමට ඇති කරගත් ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

01. මේ ප්‍රඥප්තිය 1993 අංක 05 දරන සබරගමුව පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්වෙන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මඟින් නියම කරනු ලබන දිනක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

*ආරම්භක මුදල.*

02. රුපියල් පන්ලක්ෂයක පළාත් සභා අරමුදලකින් ලබා දෙන අරමුදලින් අරමුදල ආරම්භ කළ යුතු වේ.

*අරමුදලේ මුදල්.*

03. එසේම මේ අරමුදලට බැරකර නිවාස සංවර්ධන අරමුණු සඳහා මුදල් ප්‍රදානය කිරීමට කැමති ජනතාවට හෝ එවන් මහජන ආයතනවලට හෝ මොන ආකාරයකට හෝ කෙළින්ම මේ අරමුදලේ ගිණුමට බැර කර එවන සියළුම මුදල් සහ පළාත් සභාව විසින් විටින් විට මේ අරමුදලට බැර කරන මුදල් මෙම අරමුදලේ මුදල් වේ. එසේම අරමුදලට එන සියළුම ආදායම් වල මුදල් අරමුදලේ මුදල් වේ.

*අරමුදල පවත්වා ගෙන යාම.*

04. මෙම අරමුදල ලංකා බැංකුවේ ගිණුමක් මඟින් පවත්වා ගෙන යා යුතුය. මෙම අරමුදලේ මූලික අරමුණු ඉටු කර ගැනීම පිණිස මෙම මුදල් ප්‍රයෝජනයට ගත යුතුය.

**අරමුදලේ පරිපාලනය.**

05. අරමුදල පරිපාලනය සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් නිවාස පිළිබඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් පත් කළ යුතුවේ. එම මණ්ඩලය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(i) පළාත් සභාවේ නිවාස විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා (සභාපති) ;
(ii) පළාත් සභාවේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ නියෝජ්‍ය ලේකම් ;
(iii) පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබන පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු.

මෙම වගන්තියේ (iii) අනුව පත් කරනු ලබන නිලධාරියාගේ නිල කාලය පත් කරනු ලබන දිනයේ සිට තුන් අවුරුද්දක් වන්නේ ය. තුන් අවුරුද්දකින් පසු වෙනත් නිලධාරියෙකු පත් කිරීම හෝ එම නිලධාරියාම නැවත පත් කිරීම හෝ කරනු ලැබිය හැකිය.

**අරමුදල නිදහස් කිරීම.**

06. භාරකාර මණ්ඩලය විසින් පළාත් සභාවේ නිවාස විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අවස්ථාවෝචිත පරිදි නිවාස යෝජනා ක්‍රම දුබී දුප්පත් අයට නිවාස ඉදිකිරීම සඳහා ආධාර දීම හා පළාත් සභාවේ නිවාස පිළිබඳ අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබන අරමුදලේ මූලික අරමුණු ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය වෙනත් කාර්යයන් සඳහා මෙම අරමුදලෙන් මුදල් නිදහස් කිරීමට පුළුවන.

**රෙගුලාසි සකස් කර ගැනීම.**

07. අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නොවන පරිදි අදාළ සීමාවන් තුළ අරමුදලේ මුදල් යෙදවීමේ ක්‍රම පිළිබඳව රෙගුලාසි සකස් කර ගැනීමේ බලය අමාත්‍යවරයා සතුවේ. අමාත්‍යවරයා විසින් එසේ සකස් කරනු ලබන රෙගුලාසි පළාත් සභාවට ඉදිරිපත් කොට පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ක්‍රියාත්මක කළ යුතු වේ.

**අරමුදලේ බලප්‍රදේශය.**

08. අදාළ අරමුදලේ බල ප්‍රදේශය සබරගමුව පළාත සඳහා පමණක් ක්‍රියාත්මක විය යුතුය. ජාතික නිවාස යෝජනා ක්‍රමවලට අනනුකූල වුවකි.

**නිවාස ක්‍රම සකස් කිරීමේ දී විමසිය යුතු අය.**

09. මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලාත්මක කිරීමේ දී, අත්කම් නිවාස යෝජනා ක්‍රම ඇතුළු පළාත් නිවාස යෝජනා ක්‍රම සහ ව්‍යාපෘති සකස් කිරීමේ දී අමාත්‍යවරයා විසින් සබරගමුව පළාතේ නගරාධිපතිවරුන්, පළාත් පාලන ආයතන සභාපතිවරුන්, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විමසිය යුතුය.

**විගණනය.**

10. i. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ගනු ලබන නිවාස සංවර්ධන අරමුදල විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් විය යුතුය.

ii. අරමුදලේ මුදල් වර්ෂය විය යුත්තේ සෑම වර්ෂයකම ජනවාරි මස 01 වන දයි. මුදල් වර්ෂයේ අවසානය විය යුත්තේ අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දයි.

iii. අරමුදලේ භාරකාර මණ්ඩලය, අරමුදලට ලැබුණු සියළු මුදල්, කරන ලද සියළු වියදම්, සියළු වත්කම් හා බැරකම් සහ අනෙකුත් සියළුම ගනුදෙනු වල වාර්තා නිවැරදිව තබා ගත යුතුය.

iv. අරමුදලේ භාරකාර මණ්ඩලය මුදල් වර්ෂය අවසාන වී මාස 02 ක් ඉකුත් වීමට පෙර අදාළ වර්ෂයේ ගිණුම් විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද ගිණුම් ආයතනයකට හෝ ඉදිරිපත් කළ යුතුය.

v. අරමුදලේ භාරකාර මණ්ඩලය විගණන වාර්තාව ලැබී දින 30 ක් ඉක්මවීමට පෙර එම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතුවේ. එම වාර්තාව සමඟ,

(අ) විගණනය කරන ලද ශේෂ පත්‍රය.
(ආ) විගණකාධිපතිවරයාගේ අදහස් හා නිරීක්ෂණ.
(ඇ) අදාළ මුදල් වර්ෂයේ ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් සහ වැඩ සටහන ද ඉදිරිපත් කළ යුතුය.

vi. මෙම වගන්තියේ v වන උප වගන්තියේ පරිදි තමා වෙත ලැබුණු සියළුම ලිපි ලේඛනවල පිටපත්ද සමඟින් වාර්තාව, තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත අමාත්‍යවරයා විසින් සිය වාර්තාව පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු වේ.

**අර්ථ නිරූපනය.**

11. මේ ප්‍රඥප්තියේ "අමාත්‍යවරයා" යන්නෙන් සබරගමුව පළාත් සභාවේ නිවාස විෂය භාර අමාත්‍යවරයා අදහස් කෙරේ.

"අරමුදල" යනු සබරගමුව පළාත් සභාවේ නිවාස සංවර්ධන අරමුදලය.

මෙම ප්‍රඥප්තියේ අර්ථ නිරූපණය පිළිබඳ පරස්පර භාවයක් ඇති වුවහොත්, සිංහල පිටපත අනුව අර්ථය තේරුම් ගත යුතුය.

1993 දෙසැම්බර් මස 23 වන දින පවත්වන ලද සබරගමුව පළාත් සභා රැස්වීමේ දී මෙම ප්‍රඥප්තිය ඒකච්ඡන්දයෙන් සම්මත කරන ලද බව සහතික කරමි.

හේමපාල දසනායක,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

01-123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.